සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 13 - 2023

# නාට්‍ය හා රංගකලාව (පෙරදිග) - I

කාලය පැය 03 යි

නම/ විභාග අංකය:

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

## I කොටස

(01) නෘත, නෘත්‍ය, නාට්‍ය අතරින් නෘත්ත යන්න සඳහා වඩාත් සුදුසු ප්‍රකාශය වන්නේ,
(1) ශුද්ධ නැටුම සතර අභිනයෙන් පෝෂණය වූවකි.
(2) කිසියම් භාවයක් ප්‍රකාශ වීමකි.
(3) අනුකරණය පදනම් වූ ඉදිරිපත් කිරීමකි.
(4) ශුද්ධ නැටුම හෙවත් රිද්මයානුකූල ගාත්‍රා වික්ෂේපයකි.
(5) රූකඩ නර්තනයකි. (......)

(02) ආහාර්ය අභිනය ලෙස හැඳින්වෙන්නේ,
(1) ආලෝකය හා ගීත ගායනාවන්ය. (2) වේදිකාව මත ඇති සියලු දේවල්ය
(3) නළුවා බැහැරින් ආරෝපණය කර ගන්නා දේවල්ය.
(4) ප්‍රේක්ෂකයා නාට්‍ය කෙරෙහි දක්වන ප්‍රතිචාරය.
(5) අභ්‍යන්තර සමාරෝපයයි. (......)

(03) අභ්‍යන්තර සමාරෝපයට අයත් විය හැක්කේ,
(1) සියුම් අංග රචනයයි (2) සංගීත භාවිතයයි
(3) සරල වෙස්මුහුණු භාවිතයයි (4) චරිතය වටහා ගැනීමයි
(5) වේෂ භූෂණ නිර්මාණයයි (......)

(04) පහත කෘති අතුරින් පැරණිතම කෘතිය වන්නේ,
(1) භරතමුණිගේ නාට්‍ය ශාස්ත්‍රයයි (2) ඇරිස්ටෝටල්ගේ කාව්‍ය ශාස්ත්‍රයයි
(3) ධනංජයගේ දශරූපයයි (4) නන්දිකේෂ්වරගේ අභිනය දර්පණයයි
(5) සරච්චන්ද්‍රයන්ගේ ගැමි නාටකයයි (......)

(05) ප්‍රාසංගික කලා යනු,
(1) සියලුම ලලිත කලාවන්ය.
(2) රංගනයෙන්, ගායනයෙන්, කථනයෙන් ඉදිරිපත් කරන කලාවන්ය.
(3) ශ්‍රව්‍ය දෘෂ්‍ය කලාවන්ය.
(4) ප්‍රේක්ෂකයන් පිරිසක් ඉදිරියේ සජීවිව ඉදිරිපත් කරන කලාවන්ය.
(5) නිර්මිත කලාවන්ය. (......)

(06) පහත නාට්‍ය අතුරින් බැලේ නාට්‍යක් වන්නේ කුමක් ද?
(1) කැලෑමල් (2) දෙපානෝ (3) පේමතෝ ජායතී සෝකෝ
(4) ස්නෝවයිට් (5) නට් ක්‍රැකර් (......)

(07) ඔපෙරාවට අයත් වන්නේ කුමක් ද?
(1) සැළලිහිනි සංදේශය (2) හංසවිල (3) නල දමයන්ති
(4) අග්නි (5) නිදි කුමරිය (......)

(08) ග්‍රීක ශෝකාන්ත නාට්‍යයේ ගායන වෘන්දය සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) පැරණි ග්‍රීසියේ වෘන්ද ගායකයෝ රංගනයේ යෙදුනේ නැත.
(2) තෙස්පිස් ගායන වෘන්ද ගායකයෙකු විනා රංගනයේ යෙදුනේ නැත.
(3) ඊඩිපස් නාට්‍යයේ ගායන වෘන්දය තීබ දේශයේ වයෝවෘධ ජනයාය.
(4) සොෆොකිලිස් ගායන වෘන්දය දොළහක් දක්වා අඩු කළේය.
(5) ඊස්කිලස් ගායන වෘන්දය වැදගත් කොට නොසැලකීය.

(09) රත්නාවලී ප්‍රියදර්ශිකා, නාගානන්ද නම් සංස්කෘත නාට්‍යත්‍රයේ කතුවරයා,

(1) ශ්‍රී හර්ෂ දේව ය. (2) ශුද්‍රකය. (3) භාසය

(4) කාලිදාසය (5) අශ්වඝෝෂය (......)

(10) සංස්කෘත නාට්‍යයේ ''ප්‍රාප්ත්‍යාශා'' සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) අර්ථෝපක්ෂේප පහෙන් එකකි

(2) සංස්කෘත නාට්‍යයේ සන්ධි වර්ගයකි.

(3) නේතෘගේ අරමුණ ඉටුවේද නොවේ ද යන ශංකාව ප්‍රේක්ෂකයා තුළ හටගන්නා අවස්ථාවයි.

(4) නේතෘගේ බලාපොරොත්තුව ප්‍රේක්ෂකයාට දැනගන්නට සැලසෙන අවස්ථාවයි.

(5) නේතෘගේ බලාපොරොත්තුව ඉටු වන බව ප්‍රේක්ෂකයාට වැටහෙන අවස්ථාවයි (......)

(11) අභිනය සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ අතුරින් වැරදි ප්‍රකාශය තෝරන්න.

(1) සංවාද, දෙබස්, ස්වගත භාෂණ, ගීත, වාචික අභිනයට අයත්ය.

(2) නාට්‍ය ශාස්ත්‍රයෙහි සාත්වික භාව අටක් දක්වේ.

(3) චාරි, ස්ථානක, හස්ත, කරණ ආංගික අභිනයේ ප්‍රභේද වේ.

(4) සාත්වික අභිනය යනු ''බැහැරින් ගෙන එන ලද දෑ'' යන අර්ථයයි.

(5) දර්ශන පසුතල පරිසරය ආදිය මැවීමට වාචිකාභිනයට හැකිය. (......)

◆ 12 සිට 17 දක්වා ප්‍රශ්න අංකවලට අදාලව සපයා ඇති පහත සඳහන් නාම අතර එක් නාට්‍ය සම්ප්‍රදායකට අදාළ වන නාම 03 ක් බැගින් ඇත. එම නාමවල අක්ෂර ප්‍රශ්නය ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

A - වළාකුළු

B - සකලජන

C - භාස

D - තෝමස් කීඩ්

E - නෙම්බුත්සු ඔදොරි

F - පුෂිකදෙන්

G - ක්‍රිස්ටෝපර් මාලෝ

H - ශුද්‍රක

I - ක්වන්අමි ක්යොත්සුගා

J - මණ්ඩුකයෝ

K - දෙවැනි එඩෝරා

L - ඔතොකොගත

M - ඇරිස්ටෝෆනිස්

N - කන්ජින්චෝ

O - ඉචි - නො-මත්සු

P - ඌරුභංග

Q - ද ට්වෙල්ෆ්ත් නයිට්

R - කෝපුස් ක්‍රිස්ටි

(12) සංස්කෘත නාට්‍ය (............, ................., .............)

(13) ග්‍රීක කොමඩි නාට්‍ය (............, ................., .............)

(14) එළිසබතීත නාට්‍ය (............, ................., .............)

(15) මධ්‍යකාලින නාට්‍ය (............, ................., .............)

(16) නෝ නාට්‍ය (............, ................., .............)

(17) කබුකි නාට්‍ය (............, ................., .............)

(18) ශ්‍රී ලංකාවේ පාස්කු නාට්‍යයේ ප්‍රධාන තේමාව වන්නේ,

(1) ජේසුතුමන් සිය අනුගාමිකයන් සමඟ අවසාන රාත්‍රී භෝජනය ගැනීමය.

(2) ජයඝෝෂා මධ්‍යයේ ජේරුසෙලම නුවරට වැඩම කිරීමයි.

(3) පිලාත් ආණ්ඩුකාරයා ජේසු තුමන් මරණයට තීන්දු කිරීමය.

(4) ජේසු තුමන් කුරුසපත් කිරීමය.

(5) කුරුසපත් වීම හා ඉන් තෙදිනකට පසු උත්ථානය වීමය. (......)

(19) භික්ෂූන් දෙනමක් විසින් පවත්වනු ලබන නාට්‍යමය ලක්ෂන සහිත බෞද්ධ පූජා කර්මය තෝරන්න.

(1) මිලින්ද ප්‍රශ්නය (2) දොරකඩ අස්න (3) යුගාසන බණ
(4) සති පිරිත (5) සූවිසි විවරණය (......)

(20) කොහොඹා කංකාරියේ එන ගබඩා කොල්ලය නම් අංගය පැවැත්වීමේ අරමුණ කුමක් ද?

(1) වස් දොස් දුරු කිරීමය
(2) හාස්‍ය මතු කොට දැක්වීම
(3) ගම්වැසියන් එකතු කළ ආහාර ද්‍රව්‍ය බෙදා දීම
(4) ශාන්තිකර්මයක් අවසන් කිරීමට පෙර සියලු ආම්පන්න ගිනි තැබිය යුතු වීම
(5) දෙවියන්ට වෙන් කළ ද්‍රව්‍ය නරයන් අතට පත් නොවනු පිණිස කටයුතු කිරීම (......)

(21) සන්නියකුම යාගයේ ගොටූ සතරක් සහිත ඉන හැඩයක් පළඳින්නේ කුමන සන්නියද?

(1) දේව (2) මහා කෝල (3) අමුක්කු
(4) බිහිරි (5) ඉර මුදුන් (......)

◆ ප්‍රශ්න අංක 22 සිට 26 දක්වා එක් එක් ප්‍රශ්නය සඳහා වරණ පහක් බැගින් සපයා ඇත. ඒ අතර සෙසු පද හා නොගැලපෙන පදය තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

22) (1) උත්තර රාම චරිතය (2) මායාදුන්නේ (3) ප්‍රතාප් සිං
(4) පිටිසර කෙල්ල (5) සිංහලේ හෙවත් සිංහල වීරයා (......)

(23) (1) චාල්ස් ඩයස් (2) එම්. ජී. පෙරේරා (3) පීටර් ද සිල්වා
(4) සී. දොන් බස්තියන් (5) බී. ඇල්. බෝධිපාල (......)

(24) (1) වළභා (2) මඟුල් ප්‍රස්ථාව (3) මැනේජර්
(4) වෙද හටන (5) වැරදුනු කුරුමානම (......)

(25) (1) වඩමෝඩි (2) සංකරම් (3) තෙන්මෝඩි
(4) වඩපාංග (5) තෙන්පාංග (......)

(26) (1) බහුබූතයා (2) පොතේගුරු (3) සෙල්ලාපිල්ලේ
(4) දේශනාවාදින් (5) ගුරුකම් (......)

◆ රංග කලාවේ මූලිකාංග සම්බන්ධ පහත දැක්වෙන කරුණු / පද ඇසුරින් අංක 27 සිට 31 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A - අවස්ථා | F - පසුතල | K - රඟමඬල |
| B - අධ්‍යක්ෂ | G - විභාව | L - සූත්‍රධාර |
| C - වේෂභූෂණ | H - සිද්ධි | M - ව්‍යභිචාරිභාව |
| D - කරළිය | I - අර්ථපති | N - කථාවස්තුව |
| E - භව | J - ප්‍රොසිනියම් | O - සංගීතය |

(27) නාට්‍යයේ පෙළ හා සම්බන්ධ වන්නේ,

(1) A, H හා N ය. (2) A, I හා J ය. (3) A, N හා O ය.
(4) B, E හා C ය. (5) J, K හා N ය. (......)

(28) නාට්‍ය නිෂ්පාදනය හා සම්බන්ධ වන්නේ,

(1) B, I හා L ය. (2) I, J හා L ය. (3) B, L හා O ය.
(4) D, G හා O ය. (5) I, L හා N ය. (......)

(29) වේදිකාව හැඳින්වෙන නාම වන්නේ,

(1) B, I හා J ය. (2) D, F හා N ය. (3) D, I හා J ය.
(4) D, J හා K ය. (5) E, R හා K ය. (......)

(30) අනුෂංගික අංග වන්නේ,

(1) C, K හා M ය. (2) C, F හා O ය. (3) D, F හා M ය.
(4) C, M හා O ය. (5) F, J හා O ය. (......)

(31) ප්‍රේක්ෂක රසවින්දනය හා සම්බන්ධ වන්නේ,

(1) A, E හා M ය. (2) E, M හා O ය. (3) E, G හා M ය.
(4) E, J හා N ය. (5) C, F හා N ය. (......)

(32) පහත සඳහන් නාට්‍ය අතුරෙන් සුගතපාල ද සිල්වාගේ නාට්‍යයන් නොවන්නේ කුමක් ද?
(1) මනරංජන වැඩවර්ජන (2) බෝඩිංකාරයෝ (3) දූන්න දූනුගමුවේ
(4) හරිම බඩු හයක් (5) හිත හොඳ අම්මන්ඩි (......)

(33) එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය නිර්මාණ සම්බන්ධ වැරදි ප්‍රකාශය තෝරන්න.
(1) දේශීය තොවිල් සම්ප්‍රදාය සිය නාට්‍ය සඳහා පාදක කොට ගන්නේ නැත.
(2) ''කදා වළලු'' නාඩගම් සම්ප්‍රදායෙන් බැහැරව කළ නාට්‍යයි
(3) ලෝමහංස නාට්‍යය බෞද්ධ ජාතක කතාවන් පාදක කොටගත් නාට්‍යකයකි.
(4) 'වෙස්සන්තර' ගීතාංග නාට්‍යයකි.
(5) වෙල්ලවැහුම්, මහාසාර හා බවකඩතුරා සරච්චන්ද්‍රයන්ගේ නිර්මාණයන්ය. (......)

(34) අභිඥාන ශාකුන්තලාගේ විදූෂක සම්බන්ද නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) දුෂ්‍යන්ත පෙනි සිටින සෑම අංකයකම පෙනී සිටියි.
(2) හැඳින්වෙන්නේ 'මෛත්‍රේය'' යන නාමයෙනි.
(3) දෙවන අංකය අවසානයේ ඔහු හස්තිනාපුරය බලා යන්නේ බලවත් නොකැමැත්තෙනි.
(4) කාලිදාසගේ සෙසු නාට්‍යවලට වඩා විශාලතම කාර්යභාරය ඉටු කරයි.
(5) දෙනව අංකය ආරම්භයේ දී පෙනී සිටින්නේ කළකිරුණු ස්වභාවයෙනි. (......)

(35) සකුන්තලා හස්තිනාපුරය බලා පිටත් වීමට සූදානම් වන අවස්ථාවේ ඇට ආභරණ ලැබුණේ,
(1) කාශ්‍යප තුමාගෙන් ය. (2) වනස්පතින්ගෙන් ය. (3) ගෞතමීගෙන් ය.
(4) මේනකාගෙන් ය. (5) අනසූයාගෙන්ය. (......)

(36) 'ගලින් ගල ගටාල - අන්ධකාරේ අතීතේ, ගිනිපුපුරු මැවුස්....'' කුවේණි නාට්‍යයේ එන ඉහත ගීය ගයන්නේ කවරෙක් ද?
(1) ගායකයෝ (2) පූරක (3) දඩයක්කරු
(4) ජීවහත්ත (5) දිසාලා (......)

(37) කුවේණි නාට්‍ය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) නාට්‍යධර්මී ශෛලියට ලියවී ඇත.
(2) කුවේණිය පිළිබඳ සාම්ප්‍රදායික අදහස් පෝෂණය කරයි.
(3) නාට්‍යධර්මී මෙන්ම ලෝකධර්මී ලක්ෂණ ද අන්තර්ගතය
(4) කුවේණියට ප්‍රභල චරිත නිරූපණයක් ලැබී නැත.
(5) රංගෝපකරණ කිසිවක් භාවිතා නොවේ. (......)

(38) යථාර්ථවාදී නාට්‍ය පිළිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න.
(1) යථාර්ථවාදය නැගී එන්නේ රොමැන්ටික්වාදයට එරෙහිවය.
(2) ඇන්ටන් චෙකොෆ්, බර්නාඩ් ෂෝ, මැක්සිම් ගෝර්කි යථාර්ථවාදි නාට්‍ය කරුවෝය.
(3) යථාර්ථවාදී නාට්‍ය කලාව වර්ථමානය වන විට අභාවයට ගොස්ය.
(4) ප්‍රේක්ෂකයා තත්වානුරූපී මායාවත රැඳවීම මෙම රීතියේ අපේක්ෂාවයි.
(5) මෙම නාට්‍ය රංගගත කිරීමට වඩාත් සුදුසු ප්‍රොසීනියම් වේදිකාව (......)

(39) ස්වාභාවිකවාදය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) මෙම රිතියේ පුරෝගාමියා ඕගස්ට් ස්ට්‍රින්බර්ග්ය.
(2) ද බුචර්ස් නාට්‍යයේ සැබෑ හරක් මස් වේදිකාවේ එල්ලා තැබූ බවට කියවේ.
(3) තෙරේස් රැක්වින් ස්වභාවිකවාදී නාට්‍යන් නොවේ.
(4) මෙම රීතියේ අපේක්ෂාව වූයේ නළුවා සිය චරිතයෙන් දුරස්ත වීමයි.
(5) හෙන්රික් ඉබ්සන් ස්වභාවික වාදය අනුගමනය කළේය. (......)

(40) නාට්‍ය කලාවේ ''භූමිකා' පිළිබඳ දැක්වෙන නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ජුලියස් සීසර් නාට්‍යයේ බෲටස් උත්තුංග රෝමානුවෙකුගේ භූමිකාව ඉටු නොකරයි.
(2) ඇන්ටිගනී නාට්‍යයේ රජු පියාගේ භූමිකාව අමතක කරයි.
(3) ඔතෙලෝ නාට්‍යයේ ඩෙස්ඩමෝනාට නිශ්චිත භූමිකාවන් නැත.
(4) එක් චරිතයකට භූමිකා කීපයක් රඟපාන්නට වීමෙන් නාට්‍ය රසය හීනවේ.
(5) රූපණ අභ්‍යාසවල භූමිකා රංගනයට වැදගත් ස්ථානයක් හිමිනොවේ.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 13 - 2023

# නාට්‍ය හා රංගකලාව (පෙරදිග) - II

නම/ විභාග අංකය:

## II කොටස

- A කොටසින් ප්‍රශ්න දෙකකුත් B කොටසින් ප්‍රශ්න දෙකකුත් තෝරාගෙන ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.

---

## A කොටස

01. (i) සංස්කෘත නාට්‍යක 'අර්ථප්‍රකෘති' කෙටියෙන් හඳුන්වන්න. (ල. 04)
(ii) සංස්කෘත නාට්‍යක 'අවස්ථා' යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)
(iii) සංස්කෘත හා ග්‍රීක නාට්‍ය සසඳමින් 'අවස්ථා' පැහැදිලි කරන්න. (ල. 06)

02. (i) අභිඥානශාකුන්තලය හා කුවේණි නාට්‍ය දෙකෙහි රචකයන් ගැන කෙටි හැඳින්වීමක් කරන්න. (ල. 02)
(ii) ස්ත්‍රීය පිළිබඳ රචකයන් දෙදෙනාගේ දෘෂ්ටිකෝණ පැහැදිලි කරන්න. (ල. 06)
(iii) තමන් මුහුණදුන් ගැටුම්කාරී අවස්ථාවට සකුන්තලා හා කුවේණිය මුහුණ දුන් ආකාරය පිළිබඳ ඔබේ අදහස් පැහැදිලි කරන්න. (ල. 07)

03. (i) සංස්කෘත නාට්‍යයේ අර්ථෝපක්ෂේප යන්න පැහැදිලි කරන්න. (ල. 02)
(ii) අර්ථෝපක්ෂේප ප්‍රභේද කර දක්වන්න. (ල. 06)
(iii) නාට්‍යමය උපක්‍රමයක් ලෙස අර්ථෝපක්ෂේපවල වැදගත්කම අභිඥාන ශාකුන්තලා ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 07)

## B කොටස

04. (i) එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය නිර්මාණ 4ක් නම් කරන්න. (ල. 03)
(ii) ඉහත (i) හි සඳහන් කරන ලද නිර්මාණ දෙකක් ගැන විස්තර කරන්න. (ල. 06)
(iii) 1956-2000 දක්වා කාලය තුළ සිංහල නාට්‍ය කලාවේ වැදගත් සන්දිස්ථාන සටහන් කළ නාට්‍ය පිළිබඳ විස්තරයක් කරන්න. (ල. 06)

05. (i) ශ්‍රී ලංකාවේ ශාන්තිකර්මවල අන්තර්ගත නාට්‍යමය ලක්ෂණ 4ක් ලියන්න. (ල. 04)
(ii) උඩරට, පහතරට ප්‍රදේශවල ප්‍රචලිත ශාන්තිකර්ම දෙකක් නිදසුන් සපයමින් ඔබ ඉහත I හි නම් කළ නාට්‍යමය ලක්ෂණ 2ක් විමර්ශනය කරන්න. (ල. 05)
(iii) නාට්‍යමය ලක්ෂණයන්ගෙන් අනූන ශාන්තිකර්ම තෝරාගෙන එහි රඟමඬුලු සැරසිලි හා වේෂභූෂණ ගැන සාකච්ඡා කරන්න. (ල. 06)

06. (i) නාඩගම් හි රංග භූමිය රූපසටහනක් ඇසුරින් කෙටියෙන් හඳුන්වන්න. (ල. 04)
(ii) නාඩගමෙහි ප්‍රභවය කෙටියෙන් හඳුන්වන්න. (ල. 05)
(iii) ගැමි නාටක ආකෘතියෙන් ඔබ්බට ගිය ලක්ෂණ නාඩගම් තුළ අන්තර්ගත ඇතැයි ඔබ සිතන්නේ ද? ඔබේ පිළිතුර කරුණු මගින් තහවුරු කරන්න. (ල. 06)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 13 - 2023**

# නාට්‍ය හා රංගකලාව (අපරදිග) - I

**කාලය පැය 03 යි**

| නම/ විභාග අංකය: |
|---|
| • සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. |

## I කොටස

(01) නාට්‍ය කලාව,
(1) නාට්‍ය පෙළ මත පමණක්ම රඳා පවතින්නකි.
(2) ප්‍රාග් ඓතිහාසික යුගයේ ප්‍රභවයට පත් කලාවකි.
(3) එහි නාමය නෘත් ධාතුවෙන් ප්‍රභවය වී ඇත.
(4) සෙසු ප්‍රාසාංගික කලා හා සැසඳීමේ දී සීමාසහිත කලාවකි.
(5) පරායත්ත කලාවක් සේ සැලකිය හැකිය. (......)

(02) වේදිකා පසුතල සඳහා චිත්‍ර වස්ත්‍ර බහුල ලෙස භාවිතයට ආවේ කුමන යුගයක ද?
(1) රෝම (2) මධ්‍යකාලීන (3) එලිසබතීන
(4) පුනරුද (5) රොමැන්ටික් (......)

(03) ග්‍රීක නාට්‍ය රචක ඊස්කිලස් සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ඔරෙස්ටේයි යනු ඔහුගේ ශ්‍රේෂ්ඨතම නිර්මාණයයි.
(2) ඊස්කිලස් ත්‍රෛරූපක රචනා කළේ නැත.
(3) ඔහු සටුර නාට්‍ය රචකයෙකු බවට සාධක නැත.
(4) ශෝකෝත්පාදනයට තෙවැනි නළුවා එක් කළේ ඔහුයි.
(5) ඔහුට නාට්‍ය තරගවලින් ප්‍රථම ස්ථානය හිමි වූයේ නැත. (......)

(04) සොකරි නාට්‍යයේ අනුරූපක අවස්ථා ඇතුළත් වරණය තෝරන්න.
(1) සොකරි නාට්‍යයේ නළුවන් රංගනයට පෙර පේ වීම චාරිත්‍රයකි.
(2) නැවක් තැනීම, වී කෙටීම, ගොම ගෑම ආදී අවස්ථා අන්තර්ගතය.
(3) චරිත කිහිපයක් සරල වෙස් මුහුණු පළඳිති.
(4) කමත රංගභූමිය ලෙස යොදා ගැනේ.
(5) ගුරුන්නාන්සේ විසින් චරිත හඳුන්වාදෙනු ලැබේ. (......)

(05) නාඩගම් රංග ශෛලිය පිළිබඳ කියවෙන වරණය තෝරන්න.
(1) ''හරිස්චන්ද්‍ර' ශ්‍රී ලංකාවේ ප්‍රදර්ශනය කරන ලද පැරණිතම නාඩගමයි.
(2) දේශීය කවි සඳහා නාඩගම් ආභාෂය ලැබී ඇත.
(3) පොතේගුරු හා ගායක පිරිසක් සිටී.
(4) මනමේ නාට්‍ය නාඩගම් ශෛලියේ ආභාෂය ලබා ඇත.
(5) යුරෝපීය ජනවන්දනා නාට්‍ය කලාවේ ආභාෂය ලබා ඇතැයි සැලකේ. (......)

(06) කෝළම් නාට්‍යයේ රංග ශෛලියට අදාළ නොවන ප්‍රකාශය තෝරන්න.
(1) පාත්‍ර ප්‍රවේශයට හා කථා වස්තු හැඳින්වීමට අදාළ ගායනා හා සංවාද කාරියකරවනරාළ විසින් සිදු කරනු ලැබීම
(2) වෙස්මුහුණු භාවිතය.
(3) නාට්‍යධර්මී ශෛලිය යොදා ගැනීම.
(4) ප්‍රභූ පන්තිය සරදමට ලක් කිරීම.
(5) පිරිමින් පමණක් රංගනයේ යෙදීම. (......)

(07) ගම්මඩු ශාන්තිකර්මයට අදාළ අංග වන්නේ,
(1) ඇත් බන්ධනය, කුමාර පෙළපාලිය හා මල නැටීමය.
(2) අඹ විදමන, යක් ඇන්නුම හා මරා ඉපැද්දීමය.
(3) දොළහා පෙළපාලිය, ඇත් බන්ධනය හා යක් ඇන්නුමය.
(4) රාම මැරීම, අඹ විදිමන හා මරා ඉපැද්දීමය.
(5) මී බන්ධනය, ඇත් බන්ධනය හා දුනු මාලප්පුවය. (......)

◆ පහත දක්වෙන ශාන්තිකර්ම ඇසුරින් 08 - 11 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - දෙවොල් මඩුව　　B - රටයකුම

C - දොරකඩ අස්න　　D - කොහොඹා කංකාරිය

E - සන්නි යකුම　　F - ආලවක දමනය

G - පහන් මඩුව　　H - සූනියම් යාගය

(08) වස්දොස් දුරු කිරීම හා සශ්‍රීකත්වය අරභයා සිදු කෙරෙන ශාන්තිකර්ම වන්නේ,

(1) A හා F ය.　(2) D හා E ය.　(3) A හා D ය.

(4) C හා H ය.　(5) B හා G ය.　(......)

(09) බෞද්ධ පූජාකර්ම ලෙස සැලකෙන්නේ,

(1) D හා G ය.　(2) B හා H ය.　(3) C හා F ය.

(4) F හා G ය.　(5) C හා G ය.　(......)

(10) විශේෂිත පුද්ගලයන් අරභයා සිදු කෙරෙන ශාන්තිකර්ම වන්නේ,

(1) B හා H ය.　(2) A හා G ය.　(3) D හා E ය.

(4) B හා G ය.　(5) A හා H ය.　(......)

(11) විශේෂයෙන් රෝග නිවාරණය අරමුණු කොට පැවැත්වෙන ශාන්තිකර්ම වන්නේ,

(1) D හා E ය.　(2) C හා G ය.　(3) A හා E ය.

(4) B හා H ය.　(5) E හා G ය.　(......)

(12) අභිඥානශාකුන්තලයට පදනම් වූ කථා වස්තුව හමු වන්නේ,

(1) කථා සරිත්සාගරගේ　(2) රාමායණයේ　(3) මහාභාරතයේ

(4) පද්ම පුරාණයෙනි.　(5) කාලිදාසගේ ස්වතන්ත්‍ර රචනයකි.　(......)

(13) ''රොඩී කෙල්ල'

(1) නාඩගමකි　(2) නූර්තියකි　(3) ටීටර් නාට්‍යකි

(4) මිනර්වා නාට්‍යකි　(5) කෝළම් නාට්‍යකි　(......)

(14) 'නෝ' නාට්‍යක ප්‍රධාන නළුවා හැඳින්වෙන්නේ,

(1) වකි යනුවෙනි　(2) ෂිතෙ යනුවෙනි　(3) කොකතා යනුවෙනි

(4) ෂිතෙත්සුෙරෙ යනුවෙනි　(5) වකිත්සුරෙ යනුවෙනි　(......)

(15) නූතන නාට්‍ය කලාවෙ යථාර්ථවාදී රංග රීතිය ගොඩ නැගූ ප්‍රබලයා වූයේ,

(1) හෙන්රික් ඉබ්සන් ය　(2) ස්ටැනිස්ලාව්ස්කිය　(3) මේයර්හෝල්ඩ්ය

(4) ආතර් මිලර්ය　(5) ගාර්ෂියා ලෝකාය　(......)

(16) රාජ්‍ය පාලනය හා බැඳුණු බලකාමිත්වය මූලික කරගත් එළිසබතනීය නාට්‍ය වන්නේ,

(1) ඔතෙලෝය　(2) හැම්ලට් ය　(3) ජුලියස් සීසර්ය

(4) රොමියෝ ජුලියට්ය　(5) වැනිසියේ වෙළෙන්දාය　(......)

(17) ශේක්ස්පියර්ගේ සමකාලීනයෙකු නොවන්නේ කවුරුන් ද?

(1) බෙන් ජොන්සන්　(2) ක්‍රිස්ටෝපර් මාලෝ　(3) ජෝන් ලයිලි

(4) වෝල්ටර් හේසන්තිලෙවර්　(5) රොබට් ග්‍රීන්　(......)

(18) "The myth of sisyphus (ද මිත් ඔෆ් සිසිෆස්) නාට්‍ය අයත් වන්නේ කුමන නාට්‍ය රීතියට ද?

(1) යථාර්ථවාදී　(2) සංකේතවාදී　(3) විසංගත

(4) ආඛ්‍යාන　(5) ප්‍රකාශනවාදී　(......)

(19) රොමැන්ටික් රීතිය අනුව නිර්මාණය වූ නාට්‍යය තෝරන්න.

(1) පියර්ගුන්ට්　(2) මිස් ජුලී　(3) දගෝස්ට්

(4) ද ඩ්‍රැගන්　(5) හෙඩා ගැබ්ලර්　(......)

(20) යථාර්ථවාදී නාට්‍ය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) මෙම නාට්‍යවල චරිත පැතලි බවින් යුක්තය.
(2) ආත්මභාෂණ බහුල වශයෙන් භාවිත විය.
(3) රුසියාවෙන් ආරම්භ වී යුරෝපය පුරා ව්‍යාප්ත විය.
(4) ගතානුගතික තේමා හා අන්තර්ගත සිදුවීම්වලින් ද බැහැර විය.
(5) හෙන්රි බෙක්ගේ 'ද වල්චර්ස්' යථාර්තවාදී නාට්‍යයකි. (......)

◆ ප්‍රශ්න අංක 21 සිට 26 දක්වා එක් එක් ප්‍රශ්නය සඳහා කරුණු / සංකල්ප / නාම පහ බැගින් දී ඇත. ඒ අතර සෙසුප ද හා නොගැලපෙන පදය බැගින් තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

(21) (1) ලයිසිස්ට්‍රා (2) මණ්ඩුකයෝ (3) හිපොලීටස්
(4) ප්ලූටස් (5) කුරුල්ලෝ (......)

(22) (1) සිංහාසනය (2) පැරඩෝස් (3) කව්ච්චිය
(4) එක්කුක්ලීමා (5) දොඹකරය (......)

(23) (1) ප්ලැටියා (2) චෙස්ටර් (3) ටවුන්ලි
(4) යෝකි (5) කවන්ට්‍රි (......)

(24) (1) පසුතල (2) වේෂභූෂණ (3) ආලෝකය
(4) අංග රචනය (5) සංගීතය (......)

(25) (1) ප්‍රේක්ෂාලය (2) ඕර්විස්ට්‍රා (3) ස්කීන
(4) අරිනා (5) පැරඩොයි (......)

(26) පහත සඳහන් නාට්‍ය අතරින් ශෝකජනක නාට්‍යය තෝරන්න.
(1) මෙෂර් ෆෝ මෙෂර් (2) ද ට්වෙල්ෆ්ත් නයිට් (3) ද ටේමිං ඔෆ් ද ෂ්රූ
(4) සිම්බලින් (5) කිං ලියර් (......)

(27) මධ්‍යකාලීන යුරෝපයේ ජේසුස් වහන්සේගේ 'අවසාන රාත්‍රී භෝජනය' රංගගත කිරීමට භාර කර තිබුනේ කුමන වෙළඳ ශ්‍රේණියට ද?
(1) පාන් පුළුස්සන්නන්ට (2) සන්නාලියන්ට (3) කම්මල් කරුවන්ට
(4) නැව් සාදන්නන්ට (5) රෙදි අතුල්ලන්නන්ට (......)

(28) ඊඩිපස් නාට්‍යයේ ප්‍රථම වරට වේදිකාව පිවිසෙන ගායන වෘන්දය ආයාචනා කරන්නේ කුමන දෙවිවරුන්ටද?
(1) දියොනියස්, ඇපලෝ (2) සියුස්, ඇතීනා, ඇපලෝ (3) හර්මීස්, ආටෙමිස්, ඇපලෝ
(4) ඇතීනා, ආටෙමිස් ෆීබස් (5) පොසිඩන්, එරිස්, ෆීබස් (......)

(29) ළදරු ඊඩිපස් කොරින්තයේ ගොපල්ලාට භාර දුන්නේ කුමන ස්ථානයකට ද?
(1) සිසිරියන් කඳුවැටියේ (2) ෆර්නේෂන් කඳුවැටියේ (3) ඩෙල්ෆි කඳු පාමුල
(4) ඔලිම්පස් කන්දේදී (5) ඉස්මෙනුන් නදී තෙර (......)

(30) ''නුඹට අනුකම්පා කරවී - මට ගසන ඔය ඇනුම් පද
මතු දවස දහසක් මුවින් - නුඹ වෙතම එල්ල වේවී.....''
ඊඩිපස් නාට්‍යයේ එන ඉහත සංවාද කාණ්ඩය කියන්නේ කවරෙක් ද?
(1) ගායන වෘන්දය (2) යොකස්ටා (3) ක්‍රියොන්
(4) ඊඩිපස් (5) ටෙරේසියස් (......)

(31) 'ජුලියස් සීසර්' නාට්‍යයේ පහත දැක්වෙන සංවාදය කවුරුන් විසින් කියන ලද්දේ ද?
''දැන් මේ පොම්පේ ප්‍රතිමාව ලග දූවිල්ලක් වගේ වැටිලා ඉන්න සීසර්, වේදිකාව මත දී කී වාරයක් නම් ලේ වගුරාවිද?''
(1) කැසියස් (2) ඩෙසියස් (3) සින්නා
(4) බෲටස් (5) කස්නා (......)

(32) ජුලියස් සීසර් ඝාතනයට ලක්වන්නේ නාට්‍යයේ කීවැනි අංකයේ දී ද?
(1) දෙවන අංකයේ දී (2) තුන්වන අංකයේ දී (3) පළමුවන අංකයේ දී
(4) පස්වැනි අංකයේ දී (5) සිවුවැනි අංකයේ දී (......)

(33) ජූලියට් සීසර්ට පිළිගැන්වීමට පෙත්සමක් රැගෙන එන්නේ,

(1) පේන කියන්නාය (2) ලිංග්රියස්ය (3) පබ්ලියස්ය

(4) ආටිමිඩෝරස්ය (5) සින්නාය (......)

(34) ජූලියස් සීසර් නාට්‍යයේ කැල්ෆර්නියාගේ සිහිනය ඩෙසියස් බ්රූටස් අර්ථ ගන්වන්නේ කෙසේ ද?

(1) සීසර්ට සිදුවීමට නියමිත දරුණු විපත්තියට සලකුණු පෙන්වන්නක් ලෙසය

(2) සෙනට් සභාවට නොගියහොත් බිහිසුණු අනතුරක් විය හැකි බව

(3) සීසර් නිසැකවම රෝමයේ අධිරාජ්‍යයා වන බව

(4) ශ්‍රේෂ්ඨ මිනිසුන් නැවත සීසර්ට ගෞරව බුහුමන් පුදන බව

(5) රෝමය සීසර්ගෙන් නව ජීවයක් හා පෝෂණයක් ලබා ගන්නා බව (......)

(35) හෙල්ම නෝරා අමතන විට 'පුංචි' යන විශේෂණ පදය යෙදී අර්ථය වන්නේ කුමක් ද?

(1) හෙල්ම නෝරාට දක්වන අසීමිත ආදරයයි

(2) තම දරුවන් මෙන් බිරිඳ හුරතල් කළ යුතු වීමයි.

(3) තමන් එසේ අමතනු ලැබීමෙන් නෝරා සතුටට පත් වීමයි.

(4) නෝරා පිළිබඳ හෙල්මගේ ඇති අවතක්සේරුවයි.

(5) නෝරා සහ හෙල්ම අතර දැඩි වයස් පරතරයක් පැවතීමයි. (......)

(36) රූකඩගෙදර නාට්‍යයේ එන ''තරන්තලා'' යනු කුමක් ද?

(1) වේග රිද්මයෙන් යුත් ඉතාලි ජන නර්තනයයි

(2) කැෆ්රි දිවයිනේ කාන්තා නර්තනයයි

(3) නෙපොලිටානු මසුන් අල්ලන්නියකගේ චරිතයකි.

(4) නෝර්වීජියානු සමාජ නර්තනයකි

(5) දිවි මකුළුවෙකුට කියන නාමයකි (......)

(37) 'විභාව' යනු

(1) රසයක් ඉපැදවීමට හේතුවන මනෝභාවයකි.

(2) ස්ථායිභාවයක් අවදි කරවීමට හේතුකාරක වන්නා වූ සාධකයකි.

(3) 'අනුභාව' යන්නට පර්යායවාචී ශබ්දයකි

(4) සාත්වික භාවයන්ගෙන් එකකි.

(5) මනසේ පරිපාලනයකින් තොරව බිහි වන්නා වූ ශාරීරික ප්‍රතික්‍රියා විශේෂයකි. (......)

(38) 'නේතෘ' ගේ චරිත ලක්ෂණයක් නොවන්නේ,

(1) ධීර හෙවත් ස්ථිරසාර ගුණාංගවලින් හෙබි පුද්ගලයෙකු වීමයි.

(2) ප්‍රේමයෙන් පරාජිතයෙකු වීමයි.

(3) විවිධ අභියෝගවලට මුහුණ දී අවසානයේ ජය අත්පත් කර ගැනීමයි.

(4) ස්වකීය අමාත්‍යවරුන් කෙරෙහි පූර්ණ විශ්වාසය තැබීමය.

(5) රටවැසියාගේ ගෞරවාදරයට පාත්‍ර වූවෙකු වීමයි. (......)

(39) 'නාටිකා' පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතරින් නොගැලපෙන ප්‍රකාශය තෝරන්න.

(1) 'නාටිකා' යනු පැරණි සංස්කෘත නාට්‍ය ප්‍රභේද දහයෙන් එකකි.

(2) එය අංක හතරකින් සමන්විත නාට්‍ය ප්‍රභේදයකි.

(3) නාටිකාවන් රජ පවුලේ සිද්ධීන් වටා ගෙතී ඇත.

(4) ශෘංගාරය හා හාස්‍ය නාටිකාවක මුඛ්‍ය රස ලෙස හඳුනාගනු ලැබ ඇත.

(5) එහි ගායකයා ධීරලලිත නම් වූ ස්ත්‍රී ලෝල සෙල්ලක්කාර චරිතයකි. (......)

(40) දැනට ලැබී ඇති සංස්කෘත නාට්‍ය අතරින් වැඩම නාට්‍ය සංඛ්‍යාවක් රචනා කර ඇති කවියා වන්නේ,

(1) මහාකවි කලිදාස (2) ශ්‍රී හර්ෂ දේවය (3) මහකවි භාසය

(4) රාජශේකරය (5) භවභූතිය (......)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 13 - 2023**

## නාට්‍ය හා රංගකලාව (අපරදිග) - II

නම/ විභාග අංකයඃ

## II කොටස

- **A කොටසින් ප්‍රශ්න දෙකකුත් B කොටසින් ප්‍රශ්න දෙකකුත් තෝරාගෙන ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

---

## A කොටස

01. (i) ජුලියස් සීසර් නාට්‍යයෙන් හෙළි වන ජීවන දෘෂ්ටීන් අතරින් එකක් පැහැදිලි කරන්න. (ල. 02)
 (ii) සීසර්ගේ සහ බෲටස්ගේ චරිතවලින් ගත හැකි ජීවිත පාඩම කෙටියෙන් විස්තර කරන්න. (ල. 06)
 (iii) සීසර්ගේ ඛේදජනක ඉරණම මගින් මතුවන සමාජ දේශපාලන පණිවිඩය පිළිබඳ විමසීමක් කරන්න. (ල. 7)

02. (i) එලිසබතීන (Globe) රඟහලක රූප සටහනක් ඇඳ කොටස් නම් කරන්න. (ල. 03)
 (ii) ශේක්ෂ්පියර්ගේ නාට්‍යවලට ආවේණික ලක්ෂණ නම් කරන්න. (ල. 05)
 (iii) ජුලියස් සීසර් නාට්‍යයේ උක්ත ලක්ෂණ කොතරම් දුරට දක්නට ලැබේ දැයි විමසීමක යෙදෙන්න.(ල. 07)

03. (i) යුරෝපයේ නූතන යථාර්ථවාදී නාට්‍යයේ ප්‍රරෝගාමීහු දෙදෙනා කවරහුද? (ල. 02)
 (ii) ''රූකඩ ගෙදර'' නාට්‍ය කොතෙක්දුරට යථාර්තවාදී නාට්‍යයක් දැයි විමසන්න. (ල. 06)
 (iii) ''රූකඩ ගෙදර නාට්‍යයේ නෝරාගේ ක්‍රියා කලාපය යුක්තිසහගත දැයි විමසන්න. (ල. 07)

## B කොටස

04. (i) ''ප්‍රසාංගික කලාවක් ප්‍රේක්ෂකයාට වැදගත් වන්නේ ඇයි?'' (ල. 03)
 (ii) ප්‍රේක්ෂක තෘප්තිය යනු කුමක් දැයි හඳුන්වා ප්‍රේක්ෂක තෘප්තිය කෙරෙහි බලපාන සාධක පෙන්වා දෙන්න. (ල. 05)
 (iii) නාට්‍ය කලාවේ අභිවෘද්ධිය උදෙසා ප්‍රේක්ෂක සහභාගීත්වය සහ ප්‍රේක්ෂක ප්‍රතිචාරයේ වැදගත්කම පැහැදිලි කරන්න. (ල. 07)

05. (i) නිෂ්පාදනය සඳහා නාට්‍ය පෙළක් තෝරා ගැනීමේ දී අධ්‍යක්ෂකවරුන් සැලකිල්ල යොමු කළ යුතු කරුණු දෙකක් දක්වන්න. (ල. 02)
 (ii) පෙළ තෝරා ගැනීමෙන් අනතුරුව නිෂ්පාදන ක්‍රියාවලියට ප්‍රථම ඔහු අවධානය යොමු කළ යුතු කරුණු 05 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 06)
 (iii) සාර්ථක අධ්‍යක්ෂවරයෙකු තුළ තිබිය යුතු ගුණාංග හා ශක්‍යතා කරුණු තුනක් යටතේ සාකච්ඡා කරන්න. (ල. 07)

06. (i) රූපණය පිළිබඳ සිද්ධාන්ත ඉදිරිපත් කළ බටහිර නාට්‍යවේදීන් දෙදෙනෙකු නම් කරන්න. (ල. 02)
 (ii) ඉහත i කොටසෙහි නම් කළ එක් නාට්‍යවේදියෙකුගේ රූපණ සිද්ධාන්ත පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ල. 06)
 (iii) රූපණ ශිල්පියෙකු තුළ තිබිය යුතු ගුණාංග විස්තර කොට රූපණ කාර්ය සාර්ථක කර ගැනීමෙහිලා එම කරුණු වැදගත් වන ආකාරය විස්තර කරන්න. (ල. 07)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2023

**13 ශ්‍රේණිය** **නාට්‍ය හා රංගකලාව - I** **පිළිතුරු පත්‍රය**

## I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(4) | 2 -(3) | 3 -(4) | 4 -(2) | 5 -(4) | 6 -(5) | 7 -(4) | 8 -(3) | 9 -(1) | 10 -(3) |
| 11 -(4) | 12 -(C,H,P) | 13 -(A,J,M) | 14 -(D,GQ) | 15 -(B,K,R) | 16 -(P,I,O) | 17 -(E,L,N) | 18 -(5) | 19 -(3) | 20 -(1) |
| 21 -(2) | 22 -(1) | 23 -(4) | 24 -(2) | 25 -(5) | 26 -(4) | 27 -(1) | 28 -(1) | 29 -(4) | 30 -(2) |
| 31 -(3) | 32 -(1) | 33 -(1) | 34 -(5) | 35 -(2) | 36 -(1) | 37 -(3) | 38 -(3) | 39 -(1) | 40 -(2) |

## II පත්‍රය - A කොටස

01. (i) බීජ, බිංදු, පතාකා, ප්‍රකරි, කාර්ය යන්න නම් කිරීම
බීජ - කතා වස්තුවේ ලුහුඩු සාරයයි.
බිංදු - කතා වස්තුවේ ක්‍රියාකාරී බලවේගයයි
පතාකා - ආධිකාරික කතා වස්තුව සමඟ මුල සිට අවසානය දක්වා බැඳී පවතින අතුරු චරිත
ප්‍රකරි - එක් අවස්ථාවක දී ඉස්මතු වී එයින්ම නිම වන අර්ථ ප්‍රකෘතියක්
කාර්ය - ක්‍රියාව නිම වීම (ල. 4)

(ii) ආරම්භ, යත්න ප්‍රාප්ත්‍යාසා, නියතාප්ති, පලාංගම යන්න එකිනෙක කෙටියෙන් විස්තර කිරීම සඳහා ලකුණු ලබා දෙන්න. (ල. 04)

(iii) සකුන්තලා හා ඊඩිපස් නාට්‍යවලින් නිදසුන් සපයමින් නාට්‍යක ආරම්භ යත්න ප්‍රාප්ත්‍යාසා, නියතාප්ති හා පලාගම විස්තර කිරීම (ල. 07)

(02) (i) අභිඥාන ශාකුන්තලය - කාලිදාස ගැන කෙටි හැඳින්වීමක්
කුවේණි - හෙන්රි ජයසේන පිළිබඳ කෙටි හැඳින්වීමක් (ල. 02)

(ii) ස්ත්‍රිය පිළිබඳ දෘෂ්ටිය නාට්‍ය දෙකෙන් නිදසුන් සපයමින් තහවුරු කරමින් තර්කානුකූලව ගොඩනගා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 06)

(iii) තමන් මුහුණ දුන් ගැටුම්කාරී අවස්ථාවට සකුන්තලා හා කුවේණිය මුහුණ දුන් ආකාරය පිළිබඳ සිසුවා දක්වා ඇති අදහස් කොතරම් දුරට නිවැරදි දැයි බලා ලකුණු ලබා දෙන්න. (ල. 07)

(03) (i) සංස්කෘත නාට්‍යයේ අංක දෙකක් අතර කාලය තුළ සිදුවන සිදුවීම් ප්‍රේක්ෂකයාට දැන ගැනීමට සැලැස්වීමේ සුවිශේෂී උපක්‍රමය අර්ථෝපක්ෂේප ලෙස හඳුන්වයි. (ල. 02)

(ii)
* විෂ්කම්භය
* ප්‍රවේශකය
* චූලිකා
* අංකමුඛ
* අංකාවරතාර

ලෙස නම් කර එකිනෙක කෙටියෙන් විස්තර කිරීමට ලකුණු ලබා දෙන්න. (ල. 06)

(iii) සිසු පිළිතුරුවල ඉදිරිපත් කොට ඇති කරුණුවල නිවැරදිතාවය මත සහ නිදසුන් සැපයීම මත ලකුණු ලබා දෙන්න. (ල. 07)

## II පත්‍රය - B කොටස

(04) (i) මනමේ, සිංහබාහු, කදාවළලු රත්තරං ආදි ලෙස සරච්චන්ද්‍රයන්ගේ ඕනෑම නාට්‍ය නිර්මාණ 4ක් නම් කිරීමට

(ල. 02)

(ii) ඉහත නම් කර ඇති නිර්මාණ 4න් දෙකක් තෝරා ගෙන එම නිර්මාණය පිළිබඳ දක්වා ඇති නිවැරදි කරුණු සඳහා ලකුණු ලබා දෙන්න.

(iii)

| | | | | |
|---|---|---|---|---|
| 1956 | - | මනමේ | - | සරච්චන්ද්‍ර |
| 1961 | - | සිංහබාහු | - | සරච්චන්ද්‍ර |
| 1961 | - | මුහුදු පුත්ත | - | ගුණසේන ගලප්පත්ති |
| 1961 | - | නරි බෑණා | - | දයානන්ද ගුණවර්ධන |
| 1975 | - | ගජමන් පුවත | - | දයානන්ද ගුණවර්ධන |
| 1962 | - | බක්මහ අකුණු | - | දයානන්ද ගුණවර්ධන |
| 1986 | - | ආනන්ද ජවනිකා | - | දයානන්ද ගුණවර්ධන |
| 1983 | - | මදුර ජවනිකා | - | දයානන්ද ගුණවර්ධන |
| 1962 | - | කුවේණි | - | හෙන්රි ජයසේකර |
| 1967 | - | හුණුවටයේ කතාව | - | හෙන්රි ජයසේකර |
| 1962 | - | බෝඩිංකාරයෝ | - | සුගතපාල ද සිල්වා |
| 1974 | - | සුබ සහ යස | - | සයිමන් නවගත්තේගම |
| 1978 | - | කැළණි පාලම | - | ආර්. ආර්. සමකෝන් |
| 1983 | - | තල මල පිපිලා | - | ජයලත් මනෝරත්න |
| 1996 | - | ගුරු තරුව | - | ජයලත් මනෝරත්න |

ඉහත නාට්‍ය නිර්මාණ ඇතුළත් කරමින් නාට්‍ය කලාවේ ගමන් මග විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.


(ල. 07)

(05) (i) අනුකරණය
සමාරෝපය
අනුරූපණය
සංවාද භාවිතය ආදී කරුණු 04 ක් සඳහා (ල. 02)

(ii) ශිෂ්‍යයා සපයා ඇති පිළිතුරු අනුව සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල. 06)

(iii) ශිෂ්‍යයා ඉදිරිපත් කොට ඇති ශාන්ති කර්ම හා නිදසුන් මත ලකුණු ලබා දෙන්න. (ල. 07)

(06) (i) නාඩගම් රංග භූමිය ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න.




(ල. 02)

(ii) * දක්ෂිණ භාරතීය තෙරුක්කුත්තු ආභාෂය
* පෘතුගිසි ජනවන්දනා නාට්‍ය ඇසුරින් බිහි වූවා යන මතය
* බටහිර ඔපෙරා ආභාෂය ආදී මතයන් 3න් පිළිබඳවත් කරුණු දක්වා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 06)

(iii) සිසු පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ල. 07)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2023

**13 ශ්‍රේණිය** — **නාට්‍ය හා රංගකලාව - I** — **පිළිතුරු පත්‍රය**

## I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(5) | 2 -(4) | 3 -(1) | 4 -(2) | 5 -(3) | 6 -(4) | 7 -(4) | 8 -(3) | 9 -(3) | 10 -(1) |
| 11 -(5) | 12 -(3) | 13 -(3) | 14 -(2) | 15 -(3) | 16 -(3) | 17 -(4) | 18 -(3) | 19 -(4) | 20 -(2) |
| 21 -(3) | 22 -(2) | 23 -(1) | 24 -(3) | 25 -(5) | 26 -(5) | 27 -(1) | 28 -(4) | 29 -(1) | 30 -(4) |
| 31 -(5) | 32 -(2) | 33 -(4) | 34 -(5) | 35 -(4) | 36 -(1) | 37 -(2) | 38 -(2) | 39 -(1) | 40 -(3) |

## II පත්‍රය - A කොටස

01. (i)
* බලලෝභීකම විනාශයට මුල බව
* ප්‍රායෝගික නොවන ප්‍රතිපත්තිකාමය නරක බව
* පෞද්ගලික හා පොදු අරමුණු අතර ඇති සමබරතාවය ගිලිහී යාම නිසා ඛේදනිය ඉරණමකට හොඳ වීමට සිදුවීම
* ඊර්ෂාව හා පළිගැනීම වැනි සිතුවිලිවල ප්‍රතිඵලය ඛේදනිය බව
* කතාවේ දක්ෂකමට වඩා ක්‍රියාවෙන් කටයුතු කිරීමේ වැදගත්කම
* සැකය පමණක් මුල් කරගෙන ක්‍රියා කිරීම අවදානම් සහගත බව (ල. 2)

(ii) සීසර්ගේ චරිතයෙන් හා බෲටස්ගේ චරිතයෙන් ගත හැකි ජීවන පාඩම් හෝ වෙන්ව විස්තර කර ඇත්නම් සිසු පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල. 06)

(iii) පිළිතුරු සැලකිල්ලට ගෙන ලකුණු ලබා දෙන්න. (ල. 07)

(02) (i) එළිසබතීන රඟහලක පින්තූර ඇඳ කොටස් නම් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 02)

(ii)
1. ඓතිහාසික, වංශ කතා, පුරාණෝක්ති, ජනප්‍රවාද යන විවිධ මූලාශ්‍ර ඇසුරින් නාට්‍ය නිර්මාණය කිරීම
2. වේදිකා පසුතලයක් භාවිතා නොකිරීම
3. සමාජයේ සෑම චරිතයකට අන්තර්ගත වනසේ නිර්මාණය කිරීම
4. අද්භූත සිදුවීම් බහුල වීම
5. ප්‍රභූ සමාජයේ චරිත ප්‍රධාන වීම හා ඔවුන්ගේ ඛේදනිය අවසානය
6. සර්වකාලින තේමා තිබීම

මෙම ලක්ෂණ නිදසුන් කෙටියෙන් විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. (ල. 06)

(iii) ඉහත ලක්ෂණ ජුලියස් සීසර් නාට්‍ය තුල ඇතුළත් වී ඇති අයුරු නිදසුන් සහිතව විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 07)

(03) (i) හෙන්රික් ඉබ්සන්, බර්නාඩ් ෂෝ (ල. 02)

(ii) යථාර්ථවාදී නාට්‍යයේ ලක්ෂණ රූකඩගෙදර නාට්‍යක් ඇතුළත් වන ආකාරය කෙටියෙන් විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 06)

(iii) සිසු පිළිතුරු ඉදිරිපත් කර ඇති ආකාරය සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල. 07)

## II පත්‍රය - B කොටස

(04) (i) ප්‍රාසාංගික කලාවන් සජීවී කලාවන් වන බැවින් ප්‍රේක්ෂක ප්‍රතිචාර එහි කලාවන්ට සුවිශේෂී වන බව කියවෙන පරිදි පිළිතුරු සපයා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 02)

(ii) සිසුවා ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ල. 06)

(iii) සිසු පිළිතුරු සලකාවලට ලකුණු ලබා දෙන්න. (ල. 08)

(05) (i)
* නාට්‍ය පෙළ තුළින් කියවෙන සමාජ පණිවිඩය
* නාට්‍ය තුළින් ගෙන යා හැකි සෞන්දර්යාත්මක අත්දැකීම
* නාට්‍ය පෙළ තුළින් විද්‍යාමාන වන තේමාව
* වර්තමානයට කොතෙක් ගැළපේද යන්න (ල. 02)

(ii) සිසු පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ල. 06)

(iii) සිසු පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ල. 07)